# අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

SECEDA

# පූර්ව ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරිය සබරගමුව පළාත

# පූර්ව ළමාවිය අධ්‍යාපන සංවර්ධන ඩිප්ලෝමා වැඩසටහන 2020 /2021 වර්ෂය සඳහා අයදුම්පත් කැඳවීම

සබරගමුව පළාත තුල පූර්ව පාසල් අධ්‍යාපන ක්ෂේත්‍රයේ කටයුතු කරන, එසේ කටයුතු කිරීමට අපේක්ෂිත සියලු දෙනා වෙනුවෙන් සබරගමුව පළාත් පූර්ව ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරිය එම ක්ෂේත්‍රයට අදාළ දැනුම, හැකියා, නිපුණතා සහ විශේෂඥතා ඥානය ප්‍රවර්ධනය කිරීම උදෙසා මුළුමනින් ම කැපවී කටයුතු කිරීමේ අරමුණින් මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිලිබඳ ජාතික සංවර්ධන කමිටුව යටතේ ජාතික මට්ටමේ ඩිප්ලෝමාවක් වශයෙන් කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ ළමා ලේකම් කාර්යාලයේ **ECCDNC/CS/063** අංකය යටතේ ලියාපදිංචි කරන ලද ඉහත සඳහන් පාඨමාලාවට අයදුම්පත් කැඳවනු ලැබේ.

| | |
|---|---|
| පාඨමාලාවේ නම | - පූර්ව ළමාවිය අධ්‍යාපන සංවර්ධන ඩිප්ලෝමා වැඩසටහන |
| පාඨමාලා කාලය | - මාස 18 (සති අන්ත සහ පෙර පාසල් නිවාඩු කාලයේ සතියේ දිනවල) |
| පාඨමාලා මාධ්‍ය | - සිංහල |
| පැවැත්වෙන ස්ථානය | - මෙනේරිපිටිය, අධ්‍යාපන පුහුණු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය |
| පාඨමාලා ගාස්තු | - රු 24,900 /= කි (වාරික 3 කින් ගෙවිය හැකිය) |

**1. සාමාන්‍ය සුදුසුකම් :**

i. සබරගමුව පළාතේ ස්ථිර පදිංචි අයෙකු වීම.
ii. මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත අයෙකු වීම.
iii. ඉල්ලුම් පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු 18 ට නොඅඩු සහ 45ට නොවැඩි වීම.

**2. අධ්‍යාපන සුදුසුකම් :**

**2.1** <u>දැනට සබරගමුව පළාතේ පූර්ව ළමාවිය අධ්‍යාපන සංවර්ධන මධ්‍යස්ථානයක සේවය කරන්නන් සඳහා</u>

i. අ.පො.ස (සා.පෙ) ගණිතය, මව්බස ඇතුලුව විෂයන් හයකින් සමත් වීම හා අවම වශයෙන් වසරක කාලයක් පූර්ව ළමාවිය අධ්‍යාපන සංවර්ධන මධ්‍යස්ථානයක සේවය කර තිබීම. (සම්මුඛ පරීක්ෂණයේදී සනාථ කල යුතුය. හෝ
ii. අ.පො.ස (උ.පෙළ) විෂයයන් තුනකින් සමත් වීම.

**2.2** <u>පූර්ව ළමාවිය අධ්‍යාපන ක්ෂේත්‍රයට පිවිසීමට බලාපොරොත්තු වන්නන් සඳහා</u>

i. ඕනෑම විෂය ධාරාවකින් අ.පො.ස (උ.පෙළ) විෂයයන් තුනකින් සමත් වීම.

**3. තෝරා ගැනිමේ පටිපාටිය :**

i. පාඨමාලාව සඳහා තෝරා ගන්නා අයදුම්කරුවන් සංඛ්‍යාව 160 කි. වැඩි අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත් වුවහොත් තෝරා ගැනිමේ ලිඛිත පරීක්ෂණයක් පවත්වනු ලැබේ.
ii. එම පරීක්ෂණය සාමාන්‍යය දැනීම, බුද්ධි පරීක්ෂණය හා අවබෝධය යන අංශ වලින් යුක්තය.
iii. කාලය පැය 2 කි
iv. අවසාන තෝරා ගැනීම සම්මුඛ පරීක්ෂණයකින් පසුව සිදු කෙරේ.

**4. අයදුම් කිරීම.**

4.1 අයදුම්පත් පහත සඳහන් ස්ථාන වලින් ලබා ගත හැකිය.

i. පූර්ව ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරිය, ධර්මපාල මාවත, රත්නපුර (පැමිණ හෝ ඔබගේ නම සහ ලිපිනය ලියන ලද මුද්දර ගැසූ 9x4 ප්‍රමාණයේ ලියුම් කවරයක් එවීමෙන් )

ii. කොට්ඨාස අධ්‍යාපන කාර්යාලවල ව්‍යාපෘති නිලධාරීන් / ප්‍රදේශීය ලේකම් කාර්යාලවල මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන්ගෙන්.

4.2 සම්පූර්ණ කරන ලද අයදුම්පත් ලංකා බැංකුවේ රත්නපුර ශාඛාවේ ගිණුම් අංක **77105433** වෙත ගෙවන ලද රු 500 /= (ආපසු නොගෙවන) මුදල් ගෙවූ රිසිට්පත ද සමඟ ලි.ප.තැ මඟින් **" අධ්‍යක්ෂ, පූර්ව ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරිය, ප්‍රධාන කාර්යාලය, ධර්මපාල මාවත, රත්නපුර"** යන ලිපිනයට 2020 ජුනි 30 දිනට පෙර ලැබෙන සේ ඉදිරිපත් කල යුතුය.
**(කවරයේ වම් ඉහළ කෙලවරේ " ඩිප්ලෝමා වැඩසටහන 2020 /2021 "යනුවෙන් සඳහන් කරන්න)**

4.3 අයදුම්පත සමඟ ඔබගේ නම සහ ලිපිනය ලියන ලද රු 45 /= ක මුද්දර ගැසූ ලියුම් කවරයක් ද ඉදිරිපත් කළ යුතු වේ.

**එන්.වි.ඩී.එච්.ගුණවර්ධන.**
**අධ්‍යක්ෂ,**
**පූර්ව ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරිය,**
**ධර්මපාල මාවත,**
**රත්නපුර.**